සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම
## ප්‍රාචීන පණ්ඩිත සාමාන්‍ය උපාධි අවසාන පරීක්ෂණය - 2017 (2018)

### (351) ඉතිහාසය I
### ලංකා ඉතිහාසය
### (නව/පැරණි නිර්දේශය)

පැ. තුනයි

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. (i) පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණවලට තුඩුදුන් හේතු පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*
   (ii) ඒවා අසාර්ථක වූයේ මන්දැයි පරීක්ෂා කරන්න. *(ලකුණු 12 යි)*

2. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනයේ ප්‍රතිඵල පරීක්ෂා කරන්න. *(ලකුණු 20 යි)*

3. 1638 සිට 1766 දක්වා ලන්දේසීන් සහ උඩරට රජවරුන් අතර පැවති සම්බන්ධතාවල ප්‍රධාන අවස්ථා විචාරාත්මකව විමසන්න. *(ලකුණු 20 යි)*

4. "පළමුවැනි විමලධර්මසූරිය රජතුමා උඩරට ස්වාධීන රාජ්‍යය ආරම්භ කොට එය ස්ථාවර තත්ත්වයට පත්කළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි."
   (i) පළමුවැනි විමලධර්මසූරිය රජු රජවීමට පෙර හැඳින් වූ නම කුමක් ද? *(ලකුණු 01 යි)*
   (ii) මෙතුමා විසින් පෘතුගීසින් අන්ත පරාජයට පත්කරන ලද සටන් දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*
   (iii) උඩරට රාජ්‍යය ස්වාධීනත්වයට පත්කර ගැනීමේ දී පළමුවැනි විමලධර්මසූරිය රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග සැකෙවින් දක්වන්න. *(ලකුණු 05 යි)*
   (iv) පළමුවැනි විමලධර්මසූරිය රජුගේ දේශපාලන, ආර්ථික හා ආගමික කාර්ය සංසිද්ධීන් කෙරෙහි අවධානය යොමු කරමින් ඔහු ශ්‍රේෂ්ඨ පාලකයකු වී දැයි විමසන්න. *(ලකුණු 12 යි)*

5. උඩරට රාජ්‍යයේ පරිහානියට සහ බිඳ වැටීමට තුඩුදුන් හේතු පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

### II කොටස

6. "1817 - 1818 බ්‍රිතාන්‍ය විරෝධී සටන ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස් සටන විය." එම සටනට තුඩුදුන් හේතු පැහැදිලි කරමින් මේ කියමන විමසන්න. *(ලකුණු 20 යි)*

7. "1833 කෝල්බෲක් කොමිසමේ නිර්දේශවලට අනුව සිදු කළ ප්‍රතිසංස්කරණ මඟින් මෙරට සියලු ක්ෂේත්‍ර විප්ලවීය වෙනසකට භාජනය කෙරිණ."
   (i) කෝල්බෲක් හැර එම කොමිසමට අයත් වූ තවත් පුද්ගලයකු නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (ii) කෝල්බෲක් කොමිසමේ නිර්දේශවලට අදාළව විවේචන ඉදිරිපත් කළ මෙරට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් දෙදෙනෙකු නම් කරන්න. *(ලකුණු 02 යි)*
   (iii) 1833 ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දුන් වෙනස්කම් මොනවා ද? *(ලකුණු 03 යි)*
   (iv) 1833 ප්‍රතිසංස්කරණ මඟින් සිදුකරන ලද පරිපාලන බෙදීම් සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි)*
   (v) 1833 ප්‍රතිසංස්කරණ හේතුකොට ගෙන මෙරට ආර්ථික සහ සමාජ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් වෙනහැර දක්වමින් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න. *(ලකුණු 10 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

www.pirivena.lk

8. 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටනට තුඩුදුන් හේතු සහ එහි ප්‍රතිඵල සමාලෝචනය කරන්න. *(ලකුණු 20 යි)*

9. 19 වන සියවස අග භාගයේ දී මෙරට සිදු වූ ආගමික හා සංස්කෘතික නවෝදයට තුඩුදුන් හේතු සහ එහි ව්‍යාප්තිය පිළිබඳව විග්‍රහයක් කරන්න. *(ලකුණු 20 යි)*

10. පහත දැක්වෙන මාතෘකා අතුරින් හතරක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
   (i) සීතාවක රාජසිංහ රජතුමා
   (ii) රොබර්ට් නොක්ස්
   (iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සහ උපසම්පදාව පිහිටුවීම
   (iv) 1865 දී බ්‍රිතාන්‍ය පාලකයන් විසින් වෙසක් නිවාඩුව ලබාදීම
   (v) ලංකා ජාතික සංගමය
   (vi) වාමාංශික ව්‍යාපාරය සහ සමසමාජ පක්ෂය
   (vii) ඩී.එස්. සේනානායක මහතා සහ ගොවිජනපද ව්‍යාපාර
   (viii) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

*(ලකුණු 05 × 4 = 20 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම

## ප්‍රාචීන පණ්ඩිත සාමාන්‍ය උපාධි අවසාන පරීක්ෂණය - 2017(2018)

### (352) ඉතිහාසය II

### භාරතීය ඉතිහාසය

(නව/පැරණි නිර්දේශය)

පැ. තුනයි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1. වෙලස්ලි සාමිගේ උපවාරක ගිවිසුම් ප්‍රතිපත්තිය මගින් ඉන්දියාව තුළ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය වර්ධනය වූ ආකාරය පරීක්ෂා කරන්න. *(ලකුණු 25 යි)*

2. ඉන්දියානු සමාජ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් බ්‍රහ්මෝ සමාජ්හි ඇති වැදගත්කම ප්‍රමාණ කරන්න. *(ලකුණු 25 යි)*

3. 1857 බ්‍රිතාන්‍ය විරෝධී සටන නිදහස් සටනක් ලෙස හැඳින්වීම කොතෙක් දුරට සාධාරණ දැයි විමසන්න. *(ලකුණු 25 යි)*

4. "ඉන්දියානු ජාතික සංගමය විසින් එහි ආරම්භයේ සිට ගත වූ මුල් දශක තුන තුළ අනුගමනය කරන ලද්දේ යාචක ප්‍රතිපත්තියකි." විමසන්න. *(ලකුණු 25 යි)*

5. කර්සන් සාමිගේ පාලන සමය ඉන්දියානු ජාතික හැඟීම් උත්සන්න කිරීමෙහිලා බලපෑ අයුරු පරීක්ෂා කරන්න. *(ලකුණු 25 යි)*

6. සහයෝගිතා වර්ජන ව්‍යාපාරයේ ඇති වැදගත්කම පරීක්ෂා කරන්න. *(ලකුණු 25 යි)*

7. 1935 ඉන්දියානු ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. *(ලකුණු 25 යි)*

8. 1940 පෙත් මුස්ලිම් ලීගය ක්‍රියාකළ ආකාරය පරීක්ෂා කරන්න. *(ලකුණු 25 යි)*

9. 1947 දී ඉන්දියාව දෙකඩ කිරීමට බ්‍රිතාන්‍යයන් පියවර ගත්තේ මන්දැයි පරීක්ෂා කරන්න. *(ලකුණු 25 යි)*

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.
    - (i) ස්වරාජ් පක්ෂය
    - (ii) රෝලට් පනත
    - (iii) සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය
    - (iv) සුබාස් චන්ද්‍රබෝස්

*(ලකුණු 25 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගම
## ප්‍රාචීන පණ්ඩිත සාමාන්‍ය උපාධි අවසාන පරීක්ෂණය - 2017(2018)

### (353) ඉතිහාසය III
### ලෝක ඉතිහාසය
(නව/පැරණි නිර්දේශය)

පැ තුනයි

එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. පෘතුගීසි හා ස්පාඤ්ඤ දේශ ගවේෂණ කටයුතු පහත දැක්වෙන අංශ ඇසුරෙන් සංසන්දනය කරන්න.
   (i) අරමුණු
   (ii) දේශ ගවේෂණවලට ලක් වූ ප්‍රදේශ
   (iii) ගොඩනගාගත් අධිරාජ්‍ය දෙකේ ස්වරූපය
   (ලකුණු 25 යි)

2. අමෙරිකානු නිදහස් සටන ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන සාධක සැකෙවින් සමාලෝචනය කරන්න. (ලකුණු 25 යි)

3. කාර්මික විප්ලවය හේතුකොට ගෙන එංගලන්තයේ තාක්‍ෂණික, ආර්ථික හා සාමාජික ක්ෂේත්‍රවල ඇති වූ පරිවර්තනය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 25 යි)

4. 1815 සිට 1848 තෙක් ඉතාලිය එක්සත් කිරීමට ගනු ලැබූ ප්‍රයත්න පැහැදිලි කොට ඒවා අසාර්ථක වූයේ මන්දැයි පරීක්‍ෂා කරන්න. (ලකුණු 25 යි)

5. 1848 සිට 1871 දක්වා වූ කාලය තුළ ජර්මනිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 25 යි)

### II කොටස

6. "මෙයිජි ප්‍රතිෂ්ඨාපනය ජපානය නූතන රාජ්‍යයක් බවට පත්වීමේ සන්ධිස්ථානයක් සලකුණු කරයි." සාකච්ඡා කරන්න. (ලකුණු 25 යි)

7. පළමුවන ලෝක යුද්ධය ඇති වීමට බලපෑ ප්‍රධාන සාධක ඒවායේ සාපේක්‍ෂ වැදගත්කම් අනුව විග්‍රහ කරන්න. (ලකුණු 25 යි)

8. 1917 රුසියාවේ බලය අල්ලා ගැනීමෙන් පසු බොල්ෂෙවික්වරුන් මුහුණ දුන් ප්‍රධාන ගැටලු හා අභියෝග සැකෙවින් දක්වා ඔවුන් ඒවාට මුහුණ දුන් අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 25 යි)

9. වියට්නාම් ජාතික සටන් ව්‍යාපාරයෙහිලා හෝ චි මිං විසින් ඉටු කරන ලද කාර්යභාරය ප්‍රමාණ කරන්න. (ලකුණු 25 යි)

10. දෙවන ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රතිඵල සැකෙවින් සමාලෝචනය කරන්න. (ලකුණු 25 යි)

***